# සෙල්වන් මරා දැමීම සහ වැසිකිළි බද්ද

(ලංකා ඊ නිව්ස්, 2007 නොවැ. 05 ප.ව. 7.00 -කතිකාවකි-) ඉකුත් 2 වනදා ශ්‍රී ලංකාවේ දකුණේ ප්‍රදේශ බොහොමයක රතිඤ්ඤා පුපුරන්නට පටන් ගත්තේය. ඒ, ගුවන් හමුදා ප්‍රහාරයෙන් එල්ටීටීඊ සංවිධානයේ දේශපාලන අංශ නායක තමිල් සෙල්වන් මරුමුවට පත්වීම නිමිත්තෙනි. රතිඤ්ඤා දැල්වූවන්ට පාන් ගෙඩියේ, කිරි පිටි පැකට්ටුවේ සහ සහල් කිලෝවේ මිල මොහොතකට අමතකව ගොස් තිබිණ.

සාමකාමී දේශපාලන විසඳුමකට එල්ටීටීඊ ය දිගටම දැක්වූ දඩබ්බර විරෝධයට ඔවුන්ට තම සංවිධානයේ දෙවැනියා ඇතුළු ප්‍රධාන පෙළේ දේශපාලන නායකයන් හය දෙනකුගේ ජීවිතවලින් වන්දි ගෙවන්නට සිදුව තිබුණේය. ඒ සමගම දකුණට ඊට දින කිහිපයකට පෙර අනුරාධපුර ගුවන් හමුදා කඳවුරට එල්ල වූ කොටින්ගේ ප්‍රහාරයෙන් සිදුවූ විනාශය ද අමතකව ගියේ ය.

මෙම ප්‍රහාර දෙකම දෙපාර්ශවයේ යුද මානසිකත්වය වර්ධනය කරන එකිනෙකා මරා ගැනීමේ වෑයම් උත්සන්න කරන විෂම චක්‍රයක් දෙසට යොමු වූවකි. ඉදිරියේදී උතුර හා දකුණ තව දුරටත් දෙපැත්තට වෙන්වීමේ හෙවත් ධ්‍රැවීකරණයවීමේ බරපතල අනතුර මෙන්ම යුද න්‍යාය පත්‍රයට රටේ සෙසු සියලු ප්‍රමුඛතා යටපත් කරමින් කළමණාකරණය නොකළ අවදානම් ප්‍රයාණයන් (ඇඩ්වෙන්චර්ස්) බහුල අති ධාවනකාරී මගකට යුද්ධය යොමු වීමේ ප්‍රවණතාවයක්ද ගැබ් කොට ගත්තකි. රණවිරුවන්ට උඩින් හා ගොඩින් වන්නි ගොස් ප්‍රභාකරන් නසා එන ලෙසට ආයාචනා කරන පෝස්ටර් දකුණේ ඇලවෙන්නේත්, සෙල්වන්ගේ මරණයට ලෙයට ලෙයින් පළිගන්නා බවට කොටින් සපථ කරන්නේත්, උතුරේ දින 5 ක ශෝක කාලයක් ප්‍රකාශයට පත්වන්නේත් එබැවිනි.

කවර වියදමක් දරා හෝ එල්ටීටීඊ ය අතුගා දැමිය යුතුය යන යුද මානසිකත්වය දකුණේ හිස එසවීමට මූලික වශයෙන්ම හේතු වූයේ ජවිපෙ, හෙළ උරුමය වැනි පක්ෂ හා ජාතිකවාදී ප්‍රචාරකයන්ටත් වඩා එල්ටීටීඊය මය. දකුණේ සාම ක්‍රියාකාරීන්ට යන එන මං නැති කළේත් රාජපක්ෂ ආණ්ඩුව යුද්ධය දෙසට තල්ලු කරන ලද්දේත් වෙන කිසිවකුටත් වඩා කොටි සංවිධානයම විසිනි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා බලයට පත්වූ විගස ජනාධිපතිවරණයේ තම ප්‍රධාන ගමන් සගයන් දෙදෙනාගේ නොමනාපයට ද ලක්වෙමින්, ඔවුන් සමග ඇති කොටගත් එකඟතා විවිසුම්වලට පවා පිටුපාමින් සටන් විරාම ගිවිසුම රැක ගන්නටත්, කොටින් සමග යළි සාම සාකච්ඡා ආරම්භ කරන්නටත් වෑයමක් දැරීය. ඒ බව ඔහුගේ මංගල රාජාසන කතාවෙන්ද අවධාරණය කොට තිබිණ. එහෙත් 2005 දෙසැම්බර් මුල් සතිය වන විට, එනම් රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට පැමිණ දෙසතියක් ඉක්ම යද්දී පිට පිට දින තුනක් තුළ එල්ටීටීඊ ය යාපනයේදී ක්ලේමෝ බෝම්බ ප්‍රහාර දෙකකින් ලුතිනන්වරයකු ඇතුළු හමුදා භටයන් 15 දෙනකු මරණයට පත් කරමින් එළිපිටම සටන් විරාමය කඩ කරන්නට පටන්ගෙන තිබිණ.

දේශපාලන විසඳුමකට හෝ සාම සාකච්ඡා සඳහා හෝ තමන්ගේ සූදානමක් නොමැති බව එල්ටීටීඊ ය පැහැදිලිවම ප්‍රකට කළේ මෙවර සාම සාකච්ඡා දෙවන වටයේදීය. ඒ සාම කතා සඳහා ඔස්ලෝ නුවරට පැමිණි එල්ටීටීඊ දූත පිරිස නෝර්වේ මැදහත්කරුවන්ද ශ්‍රී ලංකා රජයද අපහසුවට හා හෑල්ලුවට පත් කරමින් සාකච්ඡා ප්‍රතික්ෂේප කොට සාකච්ඡා මේසයෙන් නැගිට ඒමෙනි. යුද හමුදාපති ඝාතන තැත සමග එල්ටීටීඊ ය පිඹුරුපත් සකසන්නේ සිවුවන වන ඊළාම් යුද්ධයට බව කිසිවෙකුටත් රහසක් නොවීය.

එසේ වුවද සිව්වන ඊළාම් යුද්ධය පැනනැගී මේ මුළු වගකීම කොටින් මත පවරා අත සෝදාගන්නට ආණ්ඩුවටත්, ජනාධිපතිවරයාටත්, ඔහුගේ ප්‍රධාන මැතිවරණ සගයන් දෙදෙනාටත් නොපුළුවන. ඔවුන් රනිල් වික්‍රමසිංහ මහතාගේ 2002 සටන් විරාම ගිවිසුම නිර්දය ලෙස හෙළා දැකීම හැරෙන්නට කොටින් සාම කතා මේසයේ රැඳවා ගැනීමට හැකිවන සේ එහි අඩුපාඩු ඌන පූරණය කිරීමට කිසිම ප්‍රායෝගික වෑයමක් දැරුවේ හෝ සැලසුමක් ඉදිරිපත් කළේ හෝ නැත.

වික්‍රමසිංහ මහතා පැහැදිලිවම තම සටන් විරාමයෙන් ඉලක්ක කළේ ඡන්ද පොළ නොව වෙළෙඳ පොළය. ජාත්‍යන්තර මැදිහත්වීම් මත ඔහු සටන් විරාමයකට එළැඹෙන්නේ කොටින්ගේ ප්‍රහාරවලින් රටේ, විශේෂයෙන්ම කොළඹ ආර්ථික මර්මස්ථාන වලට අනතුරක් නැති බව සහතික කර ගන්නටය. තම 'යළි පුබුදමු ශ්‍රී ලංකා' වැඩ සටහන බාධාවකින් තොරව ක්‍රියාත්මක කරන්නටය. මේ නිසාම ආර්ථිකයට හානි නොකරන, සටන් විරාමය කඩ කරන හුදකළා සිදුවීම් කෙරෙහි ඔහු දැක්වූයේ උපේක්ෂාවකි. මෙහි දිගු කාලීන ප්‍රතිඵල වසර පහකින් ඡන්ද පොළේදී තමාට වාසියක් ගෙන දෙනු ඇතැයි ඔහු කල්පනා කරන්නට ඇතත් චන්ද්‍රිකා ජනාධිපතිනිය ඔහුට එම කාලය ලබා දුන්නේ නැත.

එදා මෙදා තුර කිසිම සටන් විරාමයකින් දෙමළ ජනතාවගේ මූලික මානුෂික ප්‍රශ්නවලට විසඳුම් නොලැබිණි. අධි ආරක්ෂිත කලාප, වෙරළ කලාපයේ කොටසක් තවමත් ධීවරයන්ට තහනම් වීම, සුනාමි සහනාධාර නොලැබීම ඇතුළුව ජීවත්වීමේ හා ජීවිතය ගැට ගසා ගැනීමේ ප්‍රශ්න රැසක් ඔවුන්ට තිබුණි. දෙමළ ජනතාවට ඔවුන් දෙමළ වූ නිසාමත්, දශක තුනක ජනවාර්ගික යුද්ධය හේතුකොට ගෙනත් මතුවූ සුවිශේෂ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට වික්‍රමසිංහ මහතා උනන්දු නොවූවාක් මෙන්ම රාජපක්ෂ රජයද ඒ ගැන මද හෝ උනන්දුවක් දැක්වූ බවක් නොපෙනේ.

තමන් දෙවන පෙළ පුරවැසියන් ලෙස සැලකීමට එරෙහිව දෙමළ ජනතාව නිදහසින් පසු ගෙන ගිය අරගලය ප්‍රජාතන්ත්‍රවාදී දෙමළ දේශපාලන පක්ෂ හා නායකයන් අතින් දෙමළ සන්නද්ධ කණ්ඩායම් අතට සහ අවසානයේදී එල්ටීටීඊ ය අතට මාරු වී ගියේ 77 දී බලයට ආ ජේ.ආර්. ආණ්ඩුව කාලයේදීය. ඒ 6 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් 'ඒකීය රාජ්‍යයට පක්ෂව දිවුරුම' නොදුන් එවකට ප්‍රධාන විපක්ෂය වූ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවෙන් නෙරපා හැරීමෙනි.

එබැවින් අද එල්ටීටීඊය සහ ප්‍රභාකරන් යන රෝග ලක්ෂණවලට කෙරෙන කවර හෝ පිළියමකින් මෙම අර්බුදය නිට්ටාවට සුවපත් කළ හැකියයි යමෙකු සිතන්නේ නම් එය මුළාවකි. මන්දයත් එල්ටීටීඊය හා ප්‍රභාකරන් මඟින් ප්‍රකාශයට පත්ව තිබෙන්නේ උතුරේ දෙමළ ජනයා පෙළන රෝග නිධානයේ තත්කාලීන ලක්ෂණ පමණක් බැවිනි. තමිල් සෙල්වන් නොව ප්‍රභාකරන් මරා දැමූවද රෝග නිධානය සුව නොවනු ඇත.

එල්ටීටීඊයට දෙමළ ජනයා මත තම ආධිපත්‍ය පටවන්නට හැකිව තිබෙන්නේ හුදෙක් තුවක්කුවේ බලයෙන්ම පමණක් නොව මෙතෙක් දකුණේ කිසිම ආණ්ඩුවක් ස්ථිරසාර බලය බෙදීමේ යෝජනාවලියකින් එල්ටීටීඊයට අභියෝග කරන්නට ඉදිරිපත්ව නොසිටීම ද නිසාය. දෙමළ ජනතාවගේ අභිලාෂයන් පිරිමැසෙන බලය බෙදීමේ දේශපාලන විසඳුමක් දකුණෙන් නිශ්චිතව ඉදිරිපත් වන්නේ නම් දෙමළ ජනයා විරුද්ධ කර ගැනීමෙන් තොරව එය ප්‍රතික්ෂේප කරන්නට එල්ටීටීඊයට නොහැකි වන්නේය. එල්ටීටීඊය සාම කතා හා සටන් විරාම පාවිච්චි කරන්නේ ජාත්‍යන්තර ප්‍රජාවේ සහයෝගය දිනා ගැනීමට සහ තම අවසාන අරමුණ වන ඊළාම් දිනා ගැනීමට ද යන විවාදාත්මක කරුණ සැබැවින්ම උරගා බැලිය හැක්කේද එවැනි විසඳුමක් ඉදිරිපත් කිරීමෙන් පමණකි.

දකුණේ ආණ්ඩුවලට පවතින සදාකාලික ගැටලුව සාම වෑයමේදී කොටින් කොතරම් අවංක ද යන කරුණය. ඔවුන් සැබැවින්ම අවංක සාම පාර්ශවකරුවන් නොවන බව අතීත අත්දැකීම් අපට ඕනෑවටත් වැඩියෙන් පෙන්නුම් කර දී තිබේ. ඔවුන් ප්‍රජාතන්ත්‍ර විරෝධී, පැසිස්ට් ත්‍රස්තවාදීන්ය. එහෙත් යුද්ධය පවතින්නේ ඔවුන් සමගය. එබැවින් අප කැමති වුවද අකමැති වුවද මෙම යුද ගැටුමට විසඳුමක් සොයා ගත යුත්තේ ඔවුන් සමඟය. එය කළ හැක්කේ දෙමළ ජනතාව සහ ජාත්‍යන්තර ප්‍රජාව සතුරු කොට නොගෙන බැහැර කළ නොහැකි, දකුණේ ද විශ්වාසය දිනා ගන්නා සාම විසඳුම් උගුලක පැනයා නොහැකි ලෙස කොටින් කොටු කිරීමෙනි.

රනිල් වික්‍රමසිංහ උදාසීන ලෙස අතපසු කළේත්, රාජපක්ෂ ආණ්ඩුවද, ජවිපෙ හා හෙළ උරුමය යන ආණ්ඩුවේ සගයන් ද එක හෙළාම විරුද්ධ වන්නේත් මෙම කරුණ ඉටු කරන්නටය. වසර දෙකක් ගත වන තුරුත් ජන වාර්ගික අර්බුදයට තමන් ලබාදෙන්නට යන දේශපාලන විසඳුමේ කටු සැලැස්මක් හෝ ඉදිරිපත් කරන්නට ජනාධිපතිවරයාටත් ඔහුගේ ආණ්ඩුවටත්, එහි ප්‍රධාන ආධාරකාර පක්ෂවලටත් නොහැකි වී තිබේ. මින් පැහැදිලි කෙරෙන්නේ සාම සාකච්ඡා සහ දේශපාලන විසඳුමකට කැපවීම ගැන කුමන

මිහිරි කතා කීවද රජයට යුද්ධය හැරෙන්නට ජනවාර්ගික ප්‍රශ්නය විසඳීමට විකල්ප දැක්මක් නොමැති බව නොවන්නේද?

අනෙක් අතට එල්ටීටීඊය දෙමළ ජනයා මත ඔවුන්ට සෙලවිය නොහැකි සේ යුද ආධිපත්‍යයක් පවත්වාගෙන යන්නේය යන යුදමය විසඳුමකට පක්ෂ අයවලුන්ගේ තර්කය ද අර්ධ සත්‍යයක් පමණි. දෙමළ ජනතාව සහ එල්ටීටීඊය ප්‍රතිවිරෝධතා සහ ගැටුම් රහිත ස්ථිතික ප්‍රපංචයක් නොවේ. කවර සටන් ව්‍යාපාරයක වුවද එහි ප්‍රකාශිත අරමුණු දිගු කාලයක් පුරා සපුරා ගත නොහැකි වූ විට එම සංවිධානයේ නායකත්වය සහ එය නියෝජනය කරන ජනතාව අතර බරපතල විසංවාදයක් හා ගැටුම් ඇති වෙයි. රජය වෑයම් කළ යුත්තේ ප්‍රබල සාම වෑයමකින් මෙම ගැටුම තියුණු කොට දෙමළ ජනතාව දේශපාලන විසඳුමක් වෙත දිනා ගැනීමය.

දශක තුනක ලේ වැකි අරගලයෙන් ප්‍රභාකරන් හා එල්ටීටීඊය දෙමළ ජනතාවට දිනා දී තිබෙන්නේ කුමක්ද? 'දණින් වැටී ජීවත්වනු වෙනුවට මරණය' යන ජව්පෙ සටන් පාඨයේ අභිමානවත් මරණයත්, කෙළවරක් නැති දුක්ඛ දෝමනස්සත් පමණක් නොවේද?

යුද්ධයට රුපියල් කෝටි සිය දහස් ගණනින් වැය කරන ආණ්ඩුව සිටින්නේ මළාපවාහන (වැසිකිලි) බද්දක් පැනවීමට තරම් බංකොලොත් තත්ත්වයකය. එල්ටීටීඊය ද ආර්ථික, යුද හා මිනිස් බලය දැඩි ලෙස පිරිහී යෑමේ අර්බුදයකට මුහුණ පා සිටියි. එබැවින් දේශපාලන විසඳුමකට මෙය හොඳම කාලය වුවද උතුරේ සහ දකුණේ ජනතාවගේ අවාසනාවට රජයත්, එල්ටීටීඊයත් වෑයම් කරන්නේ මේ විනාශකාරී යුද්ධය නිමා කරන්නට නොව ඉන් තම බලඅධිකාරිය රැක ගන්නටය. ඉන් තම පැවැත්ම තහවුරු කොට ගන්නටය. ලේ ගංගා නොකඩවා ගලා යන යුද්ධයටත් වැඩි බිහිසුණු යථාර්ථය එයයි.

- රංජිත් -